ලුණුගල ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවට අයත් ගොඩනැගිලි 06 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී අයිතිය නිශ්චිත වශයෙන් තහවුරු කරගෙන තක්සේරු කර ගිණුම්ගතකරන කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිමකර තිබුණු කලෙලමගල් දෙමළ විද්‍යාලයට ජලය සැපයීමේ ව්‍යාපෘතිය සඳහා රු. 32,203 ක් වැඩියෙන් ණයගිම් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ගිණුම් පිළියෙල කිරීමේදී ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ උසාවි දඩ ආදායම හඳුනාගෙන ලැබිය යුතු උසාවි දඩ සහ උසාවි දඩ ආදායම් ගිණුම් වල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ගිණුම් පිළියෙල කිරීමේදී ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි.. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීමේ ගිණුමක පැවති රු. 385,587 ක ශේෂයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ගිණුම් පිළියෙල කිරීමේදී ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් හා පරිත්‍යාග වශයෙන් ලැබුණු පුස්තකාල පොත් තොගයේ වටිනාකම රු. 74,075 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ගිණුම් පිළියෙල කිරීමේදී ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. |

(ආ) <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 15,795,447 ක වෙනසක් විය. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීන කර නොසැසඳීම් වලට හේතු සොයා බලා නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

(ඇ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු. 64,917,802 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ශේෂය පිළිගත් තක්සේරුකරුවන්ගේ වාර්තා සහ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | විගණනයට අදාල වන සාක්ෂි ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී තක්සේරු කිරීමට බලාපොරොත්තු වන බව සහ ඉන් පසුව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

1.4 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්</u>

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u><br>(i) 139 වගන්තිය | වරිපනම් බදු පැනවීමකට යටත් යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවා නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී වාර වාර්තා කැඳවීමට කටයුතු කරන බවත් 2019 වර්ෂය සඳහා වරිපනම් තක්සේරු කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ii) 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු. 706,845 ක හිඟ ආදායම් අය කරගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නඩු පවරා ඇති අතර ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (iii) 158,162 හා 163 වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 339,811 ක හිඟ වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කුඹුරු ඉඩම් දේපල සඳහා අක්කර බදු ගොවිජන සේවා කාරක සභාවට ගෙවන බැවින් අයකර ගැනීමට නොහැකිවී ඇති බව හා ඉදිරියේදී ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 චක්‍රලේඛය | සභාවට අයත් වාහන 10 ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | ඉදිරියේදී ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,624,747 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,464,147 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,667,000 | 1,650,989 | 1,234,376 | 414,613 | 1,607,000 | 1,657,331 | 1,157,212 | 500,120 |
| (ii) | කුලී | 7,304,950 | 5,509,241 | 4,150,725 | 1,358,516 | 6,649,625 | 4,156,830 | 3,504,825 | 652,005 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,122,000 | 914,692 | 914,692 | - | 906,000 | 806,909 | 806,909 | - |
| (iv) | වෙනත් ආදායම් | 5,960,000 | 6,743,728 | 753,637 | 5,996,091 | 3,656,000 | 3,975,345 | 975,345 | 3,000,000 |
| | එකතුව | 16,053,950 | 14,818,650 | 7,053,430 | 7,769,220 | 12,818,625 | 10,596,415 | 6,444,291 | 4,152,125 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 14,818,650 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 7,769,220 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 52 ක් විය. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | මෙම හිඟ මුදල තුල උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල්ද ඇතුලත්ව ඇති අතර මේ වන විට එම මුදල් ලැබී ඇත. |

2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 224,998 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 74,118 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 33 ක් විය. | හිඟ වරිපනම් බදු අයකරගත යුතුවේ. | 2019 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති රු. 336,656 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 265,693 ක් අයකරගෙන නොතිබුණු අතර, එය වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් මුදලින් සියයට 79 ක් විය. | හිඟ වරිපනම් බදු අයකරගත යුතුවේ. | වරිපනම් අයකිරීමේදී කුඹුරු ඉඩම් සඳහා වරිපනම් බිල්කර ඇති අතර එම ආදායම අයකර ගැනීමට හෝ ඉවත්කර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 ජල ගාස්තු ආදායම් අයකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොවී පවතින රු.1,085,458 ක ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | අයකර ගැනීමට හැකි ජල ගාස්තු අයකර ගැනීමටත් නොහැකි ඒවා කපා හැරීම සඳහා කටයුතු කරමි. |

2.2.5 වාර්ෂික දේපල බදුදීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 3,071,457 ක දේපල බදු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතුවේ. | නීතිමය කටයුතු කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.6 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකාමර කුලී රු. 706,845 ක් විය. | හිඟ දේපල බදු අයකර ගත යුතුවේ. | හිඟ අයකර ගැනීමට නීතිමය කටයුතු සිදුකර ඇත. |

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවෙන් රු. 9,090,092 ක උසාවි දඩ සහ රු. 2,863,150 ක මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | මේ වන විට මෙම හිඟ මුදල් අයවී ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් කාරණා 7 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා 7 ක් පැනවීමට කටයුතු කරමි. |

(ආ) <u>ක්‍රියාකාරි සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර නොතිබුණු අතර ඒ අනුව වර්ෂයේ ළඟාකර ගැනීමට අවශ්‍ය අරමුණු සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණි. එම නිසා වාර්ෂික කාර්යසාධනය ඇගයීමේ හැකියාව අහිමිවී ගොස් තිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරමි. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | දර්ශක හඳුනාගෙන නොතිබුණු අතර ඉදිරියේදී අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කරමි. |

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>
<u>කාර්ය මණ්ඩල පුරප්පාඩු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තනතුරු 03 කට අදාලව පැවති සේවක පුරප්පාඩු 03 ක් පුරවා නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතුවේ. | ඉදිරියේදී පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කරමි. |

3.3 <u>වත්කම් කළමනාකරණය</u>
<u>වාහනවල අයිතිය පවරා නොගැනීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් භාවිතා කරන වාහන 06 ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් වාහනවල අයිතිය පවරාගත යුතුවේ. | ඉදිරියේදී වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. |

3.4 <u>ප්‍රසම්පාදනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කරමි. |

4.2 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක ඩීඑම්ජ් / 2009 (01) දරන 2009 ජුනි 09 දිනැති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | ඉදිරියේදී විගණන කමිටුවක් පත්කර විගණන කටයුතු සිදු කරමි. |